සමාජ සවිබලගැන්වීම් හා සුබසාධන අමාත්‍යාංශය
சமூக வலுவூட்டல் மற்றும் நலனோம்புகை அமைச்சு

දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව
வாழ்வின்எழுச்சி அபிவிருத்தி திணைக்களம்
Department of Divineguma Development

1වන අධියර,4 වන මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල.
1ம் கட்டடம், 4 வது மாடி,செத்சிறிபாய பத்தரமுல்ல
1st 4th floor, Sethsiripaya ,Battaramulla

මගේ අංකය / எனது இல / My No: DDD/HO/04 /Action Plan - 2017

ඔබේ අංකය / உமது இல / Your No: ..........

දිනය / திகதி / Date: 2017.01.25

සියළුම දිස්ත්‍රික් ලේකම්වරුන්/දිස්ත්‍රික් දිවිනැගුම අතිරේක අධ්‍යක්ෂ ජනරාල්වරුන්,
දිස්ත්‍රික් දිවිනැගුම අධ්‍යක්ෂවරුන් වෙත,

**සමෘද්ධි සහනධාර ලබන පවුල් සවිබල ගැන්වීම**

උක්ත කරුණට අදාල අංක DDD/HO/04/Action Plan – 2017 හා 2017.01.17 දිනැති ලිපියට අමතරවයි.

02. උක්ත ලිපිය මගින් 2017 වර්ෂයේදි දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව මගින් ක්‍රියාත්මක කිරිමට නියමිත ව්‍යාපෘති (ආදර්ශ ගම්මාන හැර) ක්‍රියාත්මක කල යුතු ආකාරය පැහැදිලි කරන ලදි.

03. ඒ අනුව මෙම වර්ෂයේදි මෙම වැඩසටහන යටතේ පවුල් 125,000 ක් පමණ සවිබල ගැන්විමට අපේක්ෂිත වේ. මේ සඳහා අදාල ඉලක්ක කණ්ඩායම තෝරා ගැනීමේදි පහත සඳහන් නිර්ණායක පදනම්ව පවුල් තෝරා ගත යුතුවේ.

1. දැනට සමෘද්ධි ලබන පවුලක් විම.
2. කුමන හෝ ජීවනෝපාය සංවර්ධන ව්‍යාපෘතියක් සුළු පරිමාණ වශයෙන් හෝ සාර්ථකව පවත්වාගෙන යනු ලබන ප්‍රතිලාභියෙක් විම.
3. පවතින ව්‍යාපෘතිය තවදුරටත් වැඩි දියුණු කරගැනිමට උනන්දුවක්, හැකියාවක්, විභවතාවයක් පැවතීම.
4. පවතින අලෙවි ක්‍රමවේදය තුල තවදුරටත් ඉදිරියට යාමේ හැකියාව පැවතිම.

04. එමෙන්ම එම ඉලක්ක පවුල් වලින් සවිබල ගැන්විය නොහැකි පවුල් (වැඩිහිටි, ආබාධිත, පූජ්‍ය වැනි) හැර ඉතිරි පවුල් වලින් පහත සඳහන් ලෙස ආදායම අනුව වර්ගීකරණය කලහොත් ඉන් වැඩිම ආදායම ලබන (රු. 10,001/- – රු.16,000/-) කාණ්ඩයට අයත් ප්‍රතිලාභින් සවිබල ගැන්විම වඩා ප්‍රායෝගික බැවින් මෙම ආදායම් කාණ්ඩයට අයත් පවුල් තෝරා ගත යුතුවේ.

1. රු 0/- - රු 5,000/- දක්වා (පහළ ආදායම් මට්ටම)
2. රු 5,001/- - රු 10,000/- දක්වා (මධ්‍යම ආදායම් මට්ටම)
3. රු 10,001/- - රු 16,000/- දක්වා (ඉහළ ආදායම් මට්ටම)

| | අධ්‍යක්ෂ ජනරාල් / பணிப்பாளர் தலைமையதிபதி / Director General | අතිරේක අධ්‍යක්ෂ ජනරාල් / மேலதிக பணிப்பாளர்தலைமையதிபதி / Additional Director General | අධ්‍යක්ෂ(පාලන) / பணிப்பாளர் (நிர்வாகம்) / Director (Administration) | කාර්යාලය / அலுவலகம் / Office |
|---|---|---|---|---|
| Tel- | 011-2873802/2872202 | 011-2871672 | 011-2873799 | 011-2887280 |
| Fax - | 011-2889002 | 011-2887280 | 011-2873996 | **011- 2887722(Hotline)** |
| E-mail- | dg@divineguma.gov.lk | adg@divineguma.gov.lk | diradmin@divineguma.gov.lk | |

05. ග්‍රාම නිලධාරි වසම් මට්ටමින් ඉහත නිර්ණායක වලට අනුව තෝරාගත් ප්‍රතිලාභීන්ගේ තොරතුරු මේ සමග අමුණා ඇති ආකෘතියට අනුව සකස් කර එහි මෘදු පිටපත (Soft copy) 2017.02.16 දිනට පෙර අප අංශයෙහි divinegumalh@yahoo.com දරණ විද්‍යුත් අංකයට ලැබිමට සැලැස්විය යුතුවේ.

06. මෙම වසරේදී අප දෙපාර්තමේන්තුවේ සියළුම අංශ විසින් ක්‍රියාත්මක ව්‍යාපෘති ඉහත නිර්ණායක මත තෝරාගන්නා පවුල් සඳහා ප්‍රමුඛතාවය ලබා දීමට අපේක්ෂා කරන අතර එහිදි තෝරා ගන්නා පවුල් සංවර්ධනය කිරීම සැලසුම් කිරීම අත්‍යාවශ්‍ය කටයුත්තක් සේ සලකනු ලැබේ.

07. එසේ තෝරා ගන්නා සියළුම පවුල් සඳහා පවුල් තොරතුරු ඇතුලත් පවුල් පැතිකඩක් සකස් කිරිම කළ යුතුවේ. (මෙහිදි පවුල් සමීක්ෂණය සඳහා ලබාගත් තොරතුරු ප්‍රමාණවත් වේ) .

08. එමෙන්ම එම පවුල් වල අවශ්‍යතා හදුනාගෙන එම පවුල සඳහා ව්‍යාපෘති සැලැස්මක් සකස් කිරිම කළ යුතුවේ. එම සැලැස්ම සඳහා 2017.01.17 ලබා දෙන ලද ලිපියේ ඇමුණුමේ ආකෘතිය භාවිතා කල හැකි අතර එම ආකෘතිය සංකීර්ණ වන්නේ නම් වඩා සරල ලෙස ඔබ සකස් කර ගත් ආකෘතියට අනුව සැලැස්මක් සකස් කර ගැනිම අවශ්‍ය වේ.

09. එකී තොරතුරු භාවිතා කර පවුල සඳහා ක්‍රියාකාරි සැලැස්මක් (ඉහත ලිපිය සමග ලබා දි ඇති ආකෘතියට අනුව) සකස් කරගත යුතුවේ. එම ක්‍රියාකාරි සැලැස්මෙහි ඉලක්කගත පවුල සවිබලගැන්වීම සඳහා ප්‍රතිලාභියා සමග  සාකච්ඡා කරමින් අවශ්‍ය සියළුම ක්‍රියාකාරකම් ප්‍රමුඛතා අනු පිළිවෙලින් සකස් කළ යුතුවේ. එහිදි අභ්‍යන්තර සහ බාහිර යන පාර්ශව දෙකෙන්ම ක්‍රියාත්මක කිරීමට යෝජිත ක්‍රියාකාරකම් ප්‍රමුඛතා අනුපිළිවෙලට සකස් කල යුතුවේ. ක්රියාත්මක සැලැස්ම පිටපත් 03 කින් සකස් කර එක් පිටපතක් ප්‍රතිලාභියාටත්, පිටපතක් සමෘද්ධි සංවර්ධන නිලධාරි සන්තකවත්, අනෙක් පිටපත මූලස්ථාන හා ව්‍යාපෘති කළමණාකරුවන් සන්තකවත් තිබිය යුතුය.

10. ඉදිරියේදි දෙපාර්තමේන්තුව මගින් ප්‍රාදේශිය වශයෙන් ක්‍රියාත්මක කරනු ලබන ව්‍යාපෘති වලදි තෝරාගත් පවුල් වල ක්‍රියාකාරි සැලැස්මේ සඳහන් අවශ්‍යතා වලට ප්‍රමුඛත්වය ලබා දිය යුතුය. එමෙන්ම ක්‍රියාකාරි සැලැස්මේ දෙපාර්තමේන්තුවට ප්‍රාදේශිය වශයෙන් මැදිහත් විය නොහැකි  ක්‍රියාකාරකම් ඉටු කර ගැනීමට අවශ්‍ය පහසුකරණය වසම්, ප්‍රාදේශිය සහ දිස්ත්‍රික් මට්ටමින් අදාල මැදිහත් වීම කල යුතුය. මෙම පවුල් ඒකක **<u>සමෘද්ධියෙන් සවිබල ගැන්වූ ව්‍යාපෘති</u>** ලෙස නම් කළ යුතු අතර එහිදි එකී ව්‍යාපෘති සඳහා නාම පුවරුවක් සවිකර අනෙක් පවුල් අතරින් වෙන්කර හඳුනාගත හැකි සේ සංවර්ධනය කිරීම කල යුතුවේ.

නීල් බණ්ඩාර හපුහින්න
අධ්‍යක්ෂ ජනරාල්